## 01. ව්‍යාපෘතියේ නම - 'සත්කාර' සමාජ සංවර්ධන ව්‍යාපෘතිය

## 02. ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය

තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවත් වන අඩු ආදායම්ලාභී අධි අවදානම් පවුල් ඉලක්ක කරගනිමින් ඔවුන් ආර්ථික හා සමාජීය වශයෙන් ශක්තිමත් කර ඔවුනට යහපත් සමාජ ජීවිතයක් ළඟා කර ගැනීම උදෙසා තවලම ප්‍රාදේශීය ලේකම්තුමියගේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ සමාජ සංවර්ධන අංශය මඟින් පරාර්ථකාමී චේතනා පෙරදැරිව "සත්කාර" සමාජ සංවර්ධන ව්‍යාපෘතිය 2023.10.04 දින තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ආරම්භ කරන ලදී.

## 03. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද නිලධාරීන්

තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමියගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම්තුමියගේ මූලිකත්වයෙන් හා උපදෙස් මත සමාජ සංවර්ධන අංශයේ නිලධාරීන් විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන අතර සියලුම කාර්යාලයීය නිලධාරීන්ගේ සහයෝගය මේ සඳහා හිමි වේ.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | නිලූකා එල් සූරියආරච්චි | ප්‍රාදේශීය ලේකම් |
| 2 | ඩී.ජ්.ඩී.මධුභාෂිණී | සහකාර ප්‍රාදේශීය ලේකම් |
| 3 | ඒ.එන්.මහලියන | සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) |
| 4 | එල්.සී.කේ.ගුණතිලක | පරිපාලන නිලධාරී |
| 5 | ප්‍රියන්ත කුමාර දෙහිගස්පගේ | සමාජ සේවා නිලධාරී(මධ්‍යම රජය) |
| 6 | සුවිනි විශෝධනී | සමාජ සේවා නිලධාරී(පළාත් සභා) |
| 7 | සුමීර ගුරුගේ | මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරී |
| 8 | සමීර සම්පත් | සංවර්ධන නිලධාරී |
| 9 | ඉරේෂ් චතුරංග | මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරී |
| 10 | තුෂාර සම්පත් | ආපදා සහන සේවා නිලධාරී |
| 11 | දිනේෂ් පුෂ්පකුමාර | උපදේශන සේවා නිලධාරී |
| 12 | නිරෝෂා උදයංගනී | සංවර්ධන නිලධාරී |
| 13 | ලංකා රණසිංහ | සංවර්ධන නිලධාරී |
| 14 | තිලිනි මධුෂානි | සංවර්ධන නිලධාරී |
| 15 | පී.එල්.තිළිණි නිෂාදි | ළමා හිමිකම් නිලධාරී |
| 16 | කාංචනා කුලතුංග | වනිතා කටයුතු නිලධාරී |
| 17 | එස්.එස්.ධනුෂ්කා | ළමා හිමිකම් නිලධාරී |
| 18 | කේ.ජී.අයි.චන්දිමා | මුල් ළමාවිය සංවර්ධන නිලධාරී |
| 19 | ඩී.එල්.නදුනි හංසිකා | සංවර්ධන නිලධාරී |
| 20 | ශ්‍රියා රණසිංහ | කලමනාකරණ සේවා නිලධාරී |
| 21 | ඒච්.පී.ඩබ්.ඩී.කුමාරි | සංවර්ධන නිලධාරී |
| 22 | තනූජා දූෂානි | වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරී |

## 04. ව්‍යාපෘතියේ ස්වභාවය සහ හැඳින්වීම

තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 අතුරින් එකකි. මෙම කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 36කින් සමන්විත වේ. මහා පරිමාණ වතු දෙකකින් සහ කුඩා පරිමාණ 39 කින් ආවරණය වූ තවලම කොට්ඨාසයේ සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 16206 පමණ වේ. මෙම කොට්ඨාසයේ ජනගහනය 35649 කි. සමස්ත පවුල් සංඛ්‍යාව 10454 වේ. මේ අතරින් 7077 රැකියා වියුක්තියෙන් පෙලේ. මෙම ප්‍රදේශය තුළ සිංහල, දෙමළ, මුස්ලිම් ආදි ජනවර්ග සහ බෞද්ධ, කතෝලික, හින්දු, ඉස්ලාම් ආදී සෑම ආගමක් ම නියෝජනය කරන ජනතාවක් ජීවත් වේ. ගාල්ල දිස්ත්‍රික්කයේ දුෂ්කර ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන තවලම බහුතර ප්‍රජාව අඩු ආදායම්ලාභීන් වේ. එම අඩු ආදායම්ලාභී අධි අවදානම් පවුල් අතර පවතින ප්‍රධාන ගැටලුවක් ලෙස දරිද්‍රතාවය පෙන්වා දිය හැකිය.

මෙම තත්ත්වයෙන් ඔවුනට මිදීමට නොහැකි ආර්ථික හා සමාජීය භූගෝලීය කරුණු ගණනාවක් පවතී. ඒ අතර ස්ථිර පදිංචියක් සහ වාසස්ථානයක් නොමැතිකම, ආදායම් මාර්ග නොමැති වීම සහ විරැකියාවෙන් පෙළීම, මත්ද්‍රව්‍ය සහ මත්පැන් භාවිතයට හුරු වීම, අධ්‍යාපන මට්ටම දුර්වල වීම. සෞඛ්‍යය මට්ටම පිරිහීම ආදී මූලික අවශ්‍යතාවයන් ඉටු කරගත නොහැකි වීම යනාදි කරුණු පෙන්වා දිය හැකිය.

මෙකී තත්ත්වයන් පිළිබඳව සිදුකළ විමර්ශනාත්මක අධ්‍යයනයකින් පසුව තහවුරු කරගනුයේ දරිද්‍රතාවය සහමුලින්ම මුලිනුපුටා දැමීමට නොහැකි වුවද එකී අඩු ආදායම්ලාභි අධි අවදානම් මට්ටමේ පසුවන පවුල් එම තත්ත්වයන් තුළින් මුදවා යහපත් සමාජ ජීවිතයක් ඔවුනට උදාකර දීම සඳහා අවශ්‍ය මූලික අඩිතාලමට ප්‍රවේශ වීම නිලධාරින් ලෙසත් පරාර්ථකාමී පුරවැසින් ලෙසත් අපට සිදුකළ හැකි බවයි.

සිය අවශ්‍යතාවයන් වෙනුවෙන් දෛනිකව කාර්යාලයට පැමිණෙන දෙමාපියන් අහිමි දරුවන්, විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව, වැන්දඹු කාන්තාවන්, වයස්ගත වැඩිහිටියන් මෙන් ම කිසිදු හවිහරණක් නොමැති පුද්ගලයින්ගේ අවශ්‍යතා සොයා බලා ඒ සඳහා රාජකාරී මට්ටමේ කාර්යයන් ඔවුන් වෙනුවෙන් සිදුකළ ද ඇතැම් අවස්ථාවල එම සේවාලාභීන්ගේ ගැටලු සඳහා කඩිනම් විසඳුම් අවශ්‍ය අවස්ථාවන්හී දී රජයේ ක්‍රියාපටිපාටිය හරහා විසඳුම් ලබාදීමට දීර්ඝ කාලයක් ගත වේ. එවැනි අවස්ථාවක ක්ෂණික හා කඩිනම් විසඳුම් ලබාදීම අවශ්‍ය බැවින් මෙම සත්කාර සමාජ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

මෙම ව්‍යාපෘතිය හරහා ඇඳුම් පැළඳුම්, සපත්තු සෙරෙප්පු ආදිය නොමැති වතු ප්‍රජාව හා අඩු ආදායම්ලාභි අය වෙනුවෙන් එම ද්‍රව්‍ය ලබා දීම, පාසල් උපකරණ නොමැතිව පාසල් අධ්‍යාපනය අතහැර දැමූ හා අඩාළ වූ දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා පාසල් උපකරණ ලබා දීම, නිවාස අහිමි ව දැඩි දුෂ්කරතා මධ්‍යයේ දිවි ගෙවන අසරණ මිනිසුන් සඳහා නිවාස සාදා දීමට උපකාර කිරීම, එදාවේල සොයාගත නොහැකි ව ආර්ථික පරිහානියට පත් පවුල් සඳහා වියළි ආහාර හා පිසූ ආහාර ලබාදීම, විරැකියාවෙන් පෙළෙන අඩු ආදායම්ලාභී හා විශේෂ අවශ්‍යතා සහිත වූවන් රැකියාගත කර ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම, එසේ ම විවිධ අවශ්‍යතා වෙනුවෙන් කාර්යාලපරිශ්‍රය තුළට පැමිණෙන සේවාලාභින්ට මූල්‍ය අපහසුතා හේතුවෙන් සිය අවශ්‍යතාවය ඉටුකර ගත නොහැකි අවස්ථාවල දී මෙම ව්‍යාපෘතියේ අරමුදල හරහා ඊට අවශ්‍ය මුදල් ලබා දී අවශ්‍යතාවය ඉටුකර දීම යනාදිය හරහා යහපත් ආකල්පවලින් පිරිපුන් සමාජයක් ගොඩනැගීම සඳහා ආදර්ශමත් රාජ්‍ය නිලධාරින් ලෙස අපගේ කර්තව්‍ය සේවයට එහා ගිය සේවයක් ලෙස සමාජගත කිරීම මගින් නිලධාරින් මෙන් ම කාර්යාල ද ඇගයීමට හා ප්‍රශංසාවට පාත්‍ර කරළීම අපගේ අරමුණයි.

## 05. ප්‍රතිලාභී පවුල් තොරතුරු

### 5.1 සෘජු ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව

තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින දෙමාපියන් අහිමි දරුවන්, විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව, වැන්දඹු කාන්තාවන්, වයස්ගත වැඩිහිටියන්, කිසිදු හවිහරණක් නොමැති පුද්ගලයින් මෙන් ම අඩු ආදායම්ලාභීන් මෙහි සෘජු ප්‍රතිලාභීන් අතර වේ. දැනට මෙම ව්‍යාපෘතිය හරහා සෘජු ප්රතිලාභී පවුල් සංඛ්‍යාව ප්‍රමාණාත්මක ව ගත්කළ

| | සත්කාරය | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නිවාස සදා දීම | 03 |
| 02 | පාසල් උපකරණ ලබාදීම | 25 |
| 03 | සපත්තු ලබා දීම | 10 |
| 04 | ඇඳුම් ලබාදීම | 34 |
| 05 | ආහාර ලබා දීම (වියළි හා පිසූ) | 18 |
| 06 | මූලික ලේඛන සකසා දීම | 04 |
| 07 | රැකියාගත කිරීම | 02 |
| 08 | කෘෂි බෝග ලබා දීම | 42 |
| 09 | දානමය පිංකම් 03 | 21 |
| | එකතුව | 159 |

## 5.2 වක්‍ර ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව

මෙම ව්‍යාපෘතියේ ඍජු ප්‍රතිලාභී පුද්ගලයින් 159 දෙනාගේ පවුලේ සිටින සාමාජිකයින් මෙහි වක්‍ර ප්‍රතිලාභීන් වන අතර එම පිරිස සංඛ්‍යාත්මක ව ගත්කළ 393 ක් පමණ වේ.

| | සත්කාරය | වක්‍ර ප්‍රතිලාභී පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නිවාස සදා දීම | 09 |
| 02 | පාසල් උපකරණ ලබාදීම | 92 |
| 03 | සපත්තු ලබා දීම | 30 |
| 04 | ඇදුම් ලබාදීම | 85 |
| 05 | ආහාර ලබා දීම (වියළි හා පිසූ) | 56 |
| 06 | මූලික ලේඛන සකසා දීම | 08 |
| 07 | රැකියාගත කිරීම | 06 |
| 08 | කෘෂි බෝග ලබා දීම | 86 |
| 09 | දානමය පිංකම් 03 | 21 |
| | එකතුව | 393 |

## 06. ප්‍රතිලාභීන් තෝරාගත් ක්‍රමවේදය

අඩු ආදායම්ලාභි අදි අවදානම් මට්ටමේ පසුවන පවුල් මෙහි ඉලක්කගත ප්‍රතිලාභීන් වන අතර එම ප්‍රතිලාභීන් තෝරාගන්නා ක්‍රමවේදය වනුයේ කාර්යාලයීය නිලධාරීන්, වසම්භාර නිලධාරීන් සහ ප්‍රජා කමිටු දායකත්වය හා තොරතුරු මත සුදුසු ම ප්‍රතිලාභීන් සත්කාර සංවිධායක කමිටුව මගින් මෙහි දී තෝරා ගැනීම සිදුකෙරේ.

## 07. අපේක්ෂිත ඉලක්ක ලඟා කරගත් ආකාරය

### 7.1 අපේක්ෂිත ඉලක්ක

1. අවදානම් මට්ටමේ සිටින පවුල් හදුනාගෙන ඔවුන් එම අවදානම් තත්වයෙන් මුදවා ගැනිමට අවශ්‍ය ක්‍රමෝපායන් හා උපාය මාර්ග සකස් කිරීම.
2. ප්‍රතිලාභී පවුල් ආර්ථිකමය වශයෙන් දිරි ගැන්වීම.
3. පාසල් උපකරණ හා ශිෂ්‍යත්ව ප්‍රදානය හරහා ළමුන් දිරි ගැන්වීම.
4. ස්වයං රැකියා හා ස්ථිර රැකියා බිහිකරමින් ආර්ථික වශයෙන් දිරි ගැන්වීම.
5. නිවාසයක් නොමැතිව පීඩා විඳින පවුල් සඳහා නිවාස තනා දීම සහ ඔවුන්ගේ නිවාස සිහිනය යථාර්ථයක් කරළීම.
6. අඩු ආදායම්ලාභී ආන්තික ප්‍රජාව වෙනුවෙන් භාවිත කළ නොකළ ඇදුම් පැළදුම්, සපත්තු සෙරෙප්පු, මෙන් ම වියළි සලාක ලබා දීම තුළින් ආර්ථිකමය වශයෙන් යම් අස්වැසිල්ලක් ලබා දීම.
7. අඩු ආදායම්ලාභීන් උදෙසා ප්‍රජා දායකත්වය ලබා ගැනීම.
8. රාජ්‍ය නිලධාරින් සහ රාජ්‍ය ආයතන කෙරෙහි යහපත් ප්‍රතිරූපයක් ගොඩනැගීම.

### 7.2 යෙදවුම්

මෙම "සත්කාර සමාජ සංවර්ධන ව්‍යාපෘතිය" පවත්වාගෙන යාම සඳහා නිලධාරීන්ගේ පෞද්ගලික පරිත්‍යාග මෙම වැඩසටහන සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් උපයාගැනීම අනුග්‍රාහක භවතුන්ගේ මෙන් ම විවිධ සංවිධාන ඇතුළුව ප්‍රදේශවාසී පරිත්‍යාගශීලීන්ගේ හා ප්‍රදේශයේ රාජ්‍ය අයතන හා පෞද්ගලික ආයතනවල අනුග්‍රහය ඇතිව සිදු කරන ලදි.

එහිදි කාර්යාල නිලධාරීන්ගේ සහ ප්‍රදේශවාසීන්ගේ භාවිත කළ සහ නොකළ ඇදුම්-පැළදුම්, සපත්තු-පාවහන් ආදිය එක්රැස් කර සුදුසු ප්‍රතිලාභීන්ට ලබා දීම සිදු කරන ලදි.

ඊට අමතර ව වියළි ආහාර ද්‍රව්‍ය සහ පාසල් උපකරණ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා මූල්‍ය ආධාර රාජ්‍ය නිලධාරින්ගෙන්, අනුග්‍රහක භවතුන්ගේ මෙන් ම විවිධ සංවිධාන හරහා එක්රැස් කර සුදුසු ප්‍රතිලාභීන්ට බෙදාදීම සිදුකෙරේ.

එසේම මෙම සත්කාර ව්‍යාපෘතිය සඳහා අරමුදලක් පිහිටුවා ඇති අතර ඊට අවශ්‍ය මුදල් එක්රැස් කරගැනීම මුදල් ආධාර කැට කිහිපයක් කාර්යාලයීය පරිශ්‍රය තුළ පවත්වා ගෙන යන අතර, එම මුදල් මෙම වැඩසටහනේ ප්‍රතිලාභින් සඳහා අවශ්‍ය වන පාසල් උපකරණ ලබා දීම, ශිෂ්‍යත්ව ප්‍රදානය ආදී පාසල් ළමුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් මෙන් ම කාර්යාල පරිශ්‍රය තුළට පැමිණෙන සේවාලාභින්ට මූල්‍ය අපහසුතා හේතුවෙන් අවශ්‍යතාවය ඉටුකර ගත නොහැකි අවස්ථාවල දී මෙම අරමුදල හරහා ඊට අවශ්‍ය මුදල් ලබා දී අවශ්‍යතාවය ඉටුකර දීම සිදු කරන ලදී.

## 7.3 ක්‍රියාකාරකම්

මෙම ව්‍යාපෘතිය විවිධ අංශ ආවරණය වන පරිදි අදියර කිහිපයක් යටතේ දැනට ක්‍රියාත්මක වේ. එනම්

I. **අදියර -** මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නොහැකි අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් මැදිහත් වී කටයුතු කිරීම
II. **අදියර -** අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.
III. **අදියර** - නිවාස අහිමි පුද්ගලයින් වෙනුවෙන් කැණි මඩළ නමින් නිවාස සත්කාරමය වැඩසටහනක් නිර්මාණය කිරීම.
IV. **අදියර -** කාර්යාලයට පැමිණෙන සේවාලාභින්ගේ අවශ්‍යතා වෙනුවෙන් මැදිහත් වී කටයුතු කිරීම.
V. **අදියර** - අඛණ්ඩව දානය නොලැබෙන විහාරස්ථාන සඳහා දානය සපයා දීමට මැදිහත් වී කටයුතු කිරීම.
VI. **අදියර -** මෙම වැඩසහටහන සඳහා අවශ්‍ය මුදල් එක්රැස් කරගැනීම සඳහා අරමුදලක් පිහිටුවීම

### 7.3.1 අදියර - මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නොහැකි අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙනුවෙන් මැදිහත් වී කටයුතු කිරීම.

මෙම වැඩසටහනේ මූලාරම්භය දෛනික අවශ්‍යතාවයන් වෙනුවෙන් කාර්යාලයට පැමිණෙන අඩු ආදායම්ලාභී ආන්තික ප්‍රජාව වෙනුවෙන් භාවිත කළ නොකළ ඇඳුම් පැළඳුම්, සපත්තු සෙරෙප්පු, මෙන් ම කෑම පාර්සල් ලබාදීම මෙම ව්‍යාපෘතියේ මූලාරම්භයයි. මේ සඳහා කාර්යාලයීය නිලධාරීන්ගේ පරිත්‍යාග මහෝපකාරී විය.

එහි තවත් එක් දිගුවක් ලෙස කාර්යාල නිලධාරීන් සහ වෙනත් අනුග්‍රාහක භවතුන් පරිහරණය කර ඉවත් කරන ලද හෝ ඔවුන්ට භාවිත කළ නොහැකි ඇඳුම් පැළඳුම්, සපත්තු සෙරෙප්පු ආදිය මෙන් ම වියළි ආහාර ද්‍රව්‍ය එක්රැස් කර ගබඩා කරගනිමින් සුදුසු ප්‍රතිලාභීන්ට එම ද්‍රව්‍ය ලබාදීම ඉතා සංවිධානාත්මක ව සිදුකරන ලදි. මේ හරහා විශාල ද්‍රව්‍ය ප්‍රමාණයක් එක්රැස් කරගැනීමටත්, වතු ආශ්‍රිත අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත ඒවා බෙදාදීමටත් හැකි විය.

මීට අමතරව ආර්ථික වශයෙන් දුර්වල මට්ටමේ පසුවන සහ විරැකියාවෙන් පෙළෙන අඩු ආදායම්ලාභීන් හට ස්වයං රැකියා සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම හා රැකියාගත කිරීම ද මෙම ව්‍යාපෘතිය හරහා සිදුකරන ලදි.

- සපත්තු සෙරෙප්පු ලබා දීම
- වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීම
- ඇඳුම් පැළඳුම් ලබාදීම.
- ස්වයං රැකියා සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම හා රැකියාගත කිරීම

❖ ඇඳුම් පැළඳුම් ලබාදීම.









❖ සපත්තු සෙරෙප්පු ලබා දීම









❖ වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීම.









- ස්වයං රැකියා සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම හා රැකියාගත කිරීම

දාම්මල ජනපදයේ පදිංචි යූ.ජී.තිසර ලක්ෂාන් වන මොහු ශ්‍රවන හා කථන අපහසුතා සහිත තරුණයෙකි. දැනට ඕපාත බ්‍රයිට් අෆ් ඇපරල් ඇඟලුම් ආයතනයේ මැෂිං ඔපරේටර්වරයෙකු ලෙස අපගේ මඟපෙන්වීම යටතේ සේවය කරනු ලබයි.





- කෘෂි භෝග ලබා දීම









## **7.3.2 අදියර -** අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

අඩු ආදයම්ලාභී පවුලවල බොහෝ දරුවන් ප්‍රමාණයක් පාසල් උපකරණ නොමැතිකම හේතුවෙන් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දමයි. මෙම තත්වයෙන් ඔවුන් මුදවාගනිමින් ඔවුන්ගේ අධ්‍යාපනය යළි නගා සිටුවමින් ඊට අවශ්‍ය පාසල් උපකරණ ලබා දී ඔවුන් ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ තවත් එක් පැතිකඩකි.

මේ සඳහා අවශ්‍ය පාසල් උපකරණ එක්රැස් කරගැනීම විවිධ අනුග්‍රහක භවතුන්ගේ පරිත්‍යාග මත සිදුකරන අතර ඊට අමතරව කාර්යලයීය පරිශ්‍රය තුළ හා ඉන් පරිබාහිර ව්‍යාපාර ආයතන තුළ අකුරට සවියක් නමින් මුදල් කැට තබා ඊට අවශ්‍ය මුදල් සපයාගැනීම සිදුකරනු ඇත.

- පාසල් උපකරණ ලබාදීම
- පාසල්ගත කිරීමට අවශ්‍ය මූලික ලේඛන සකස්කර දීම.
- පාසල් නොයන ළමුන් පාසල්ගත කිරීම.






### 7.3.3 අදියර - නිවාස අහිමි පුද්ගලයින් වෙනුවෙන් කැණි මඩළ නමින් නිවාස සත්කාරමය වැඩසටහනක් නිර්මාණය කිරීම.

සමාජ සේවා අංශයට පැමිණෙන සේවාලාභීන් අතරින් බහුතරයක් නිවාස ගැටලු සම්බන්ධ ඒවාය. විවිධ විෂය පථයන් යටතේ එම නිවාස අවශ්‍යතා සම්පූර්ණ කළ ද ඇතැම් නිවාස ඉදිකරදීම එකී විෂයන් තුලින් සිදුකිරීමට නොහැකි විය. මෙවැනි ගැටලුකාරී මට්ටමේ පැවතිය ද එකී නිවාස ඉදිකර දීම අත්‍යවශ්‍ය වූ අවස්ථාවල දි අප සත්කාරක ව්‍යාපෘතිය හරහා ඊට මැදිහත් වී ඔවුනොවුන්ගේ නිවාස සිහිනය ගොඩනැගීම වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ශක්තිය ලබාදෙන ලදි.

- **ස්ථිර නිවාස සම්පූර්ණ ලෙස ඉදිකර දීම.**






- ❖ **අඩක් ඉදිකළ නිවාස සම්පූර්ණ කිරීම.**

- ❖ **තාවකාලික නිවාස තනා දීම.**







### 7.3.4 **කාර්යාලයට පැමිණෙන සේවාලාභින්ගේ අවශ්‍යතා වෙනුවෙන් මැදිහත් වී කටයුතු කිරීම.**

කාර්යාලයට පැමිණෙන අඩු ආදායම්ලාභි පුද්ගලයින්ට සිය අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට මුදල් බාධාවක් වූ විට ඔවුනොවුන්ගේ අවශ්‍යතාවය සලකා බලා ඊට අවශ්‍ය මුදල් අපගේ සත්කාර අරමුදලෙන් ලබා දී ඒකි කර්තව්‍ය ඉටුකර වඩාත් ඵලදායි හා සුහදශීලී සේවාවක් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලැබේ.

- ❖ උප්පැන්න සකස් කරගැනීමට මුදල් ලබා දීම.
- ❖ නීත්‍යානුකූලව විවාහ නොවූ අය විවාහ කරදීම


15


STOP





### 7.3.5 අදියර- අඛණ්ඩව දානය නොලැබෙන විහාරස්ථාන සඳහා දානය සපයා දීමට මැදිහත් වී කටයුතු කිරීම.

කොට්ඨාසයේ පවතින විහාරස්ථානවලට අඛණ්ඩව දානය නොලැබෙන අවස්ථාවලදී ඒ් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීමෙන් පසු සත්කාර වැඩසටහන මගින් ඒම විහාරස්ථානවලට අවශ්‍ය දානය සපයා දීමට මැදිහත් වීම. මෙහිදි මෙම සත්කාරය අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා සුදුසු වැඩපිළිවෙළක් ලෙස කාර්යාලයේ සියලු අංශවලට මෙහි වගකීම පවරාදීම හා ඔවුනොවුන් එකී සත්කාරය සඳහා සම්බන්ධ කරගැනීම. දැනට මෙහි ආරම්භය තවලම ශ්‍රී සුභාෂිතාරාමය මුලික කරගනිමින් සිදුකරන ලදි.

- සමාජ සේවා අංශය  මගින් ලබාදුන් දානමය පිංකමේ ඡායාරූප





- ළමා ඒකකය  මගින් ලබාදුන් දානමය පිංකමේ ඡායාරූප







## 7.3.6 අදියර - මෙම වැඩසටහන සඳහා අවශ්‍ය මුදල් එක්රැස් කරගැනීම සඳහා අරමුදලක් පිහිටුවීම.

මෙම ව්‍යාපෘතිය මුල් කාලීනව ද්‍රව්‍ය මත පදනම් ව සිදුකළ ද පසුකාලීන ව මෙකී සත්කාරය පුළුල් වීමත් සමග මුදල් අවශ්‍ය වූ බැවින් ඒ සඳහා අරමුදලක් පිහිටුවීමට තීරණය කරන ලදි. ඒ අනුව ඒකී අරමුදල සඳහා මුදල් රැස්කර ගැනීම විවිධ අනුග්‍රහක භවතුන් හා සංවිධාන මෙන් ම ප්‍රදේශවාසීන්ගේ සහයෝගය මත සිදුකරන ලදි. ඒ සඳහා මුදල් කැට කිහිපයක් ද විවිධ ස්ථානවල ඉතා සුරක්ෂිත ව තබා ඇත. මෙම මුදල් නිරතුරුවම සත්කාර සංවිධායක කමිටුවේ අධීක්ෂණයට ලක්වන අතර කිසිදු ආකාරයකින් අවභාවිත වීමක් සිදුනොවන අතර උපරිම විනිවිදභාවයකින් යුතුව කටයුතු කරනු ලැබේ.

- ❖ මුදල් ලේඛනයක් නඩත්තු කිරීම.




- ❖ භාණ්ඩ එක් රැස් කර තැබීම සඳහා සත්කාර භාණ්ඩ සංචිතයක් පවත්වා ගෙන යාම.






- ❖ මුදල් එක්රැස් කරගැනීමට මුදල් කැට තැබීම.







වාහන ආදායම්



❖ සමාජ මාධ්‍ය හරහා මුදල් එක්රැස් කරගැනීමට වීඩියෝපට හා පෝස්ට් නිර්මාණය






## 7.4 නිමැවුම්

- ❖ සත්කාර මුදල් ආධාර කැටය මගින් ළමුන්ගේ පාසල් ගමන අඛණ්ඩව පවත්වා ගෙන යාම උදෙසා පාසල් උපකරණ 92ක් ලබා දීම සිදු කිරීම
- ❖ පාසල් ගත කළ ළමුන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම 5ක් ලබා දීම.
- ❖ උප්පැන්න සහතික නොමැති දරුවන් උදෙසා උප්පැන්න සහතික 4 ක් සකස් කිරීම.
- ❖ නීත්‍යානුකූලව විවාහ නොවූ අය විවාහ කරදීම් 4ක් සිදු කිරීම.
- ❖ නිවාස සදා දීම් 3ක් සිදු කිරීම.
- ❖ 85 දෙනෙකු සඳහා ඇඳුම් ලබා දීම.
- ❖ වියළි හා පිසූ ආහාර 56 දෙනෙකු සඳහා ලබා දීම.
- ❖ දෙදෙනෙක් ස්ථිර රැකියාගත කිරීම.
- ❖ පවුල් 42 ක් සඳහා කෘෂි භෝග ලබාදීම.
- ❖ දානමය පිංකම් 3ක් සිදු කිරීම.

## 7.5 ළඟා කරගත් ඉලක්ක

- ❖ අවදානම් මට්ටමේ සිටින පවුල් හඳුනාගෙන ඔවුන් එම අවදානම් තත්වයෙන් මුදවා ගැනිමට අවශ්‍ය ක්‍රමෝපායන් හා උපාය මාර්ග සකස් කිරීමට හැකි වීම.
- ❖ ප්‍රතිලාභී පවුල් ආර්ථිකමය වශයෙන් දිරි ගැන්වීමට හැකි වීම.
- ❖ පාසල් උපකරණ හා ශිෂ්‍යත්ව ප්‍රදානය හරහා ළමුන් දිරිමත් වීම.
- ❖ ස්වයං රැකියා හා ස්ථිර රැකියා සඳහා අඩු ආදායම්ලාභීන් යොමු කිරීමට හැකි වීම.
- ❖ නිවාසයක් නොමැතිව පීඩා විඳින පවුල් සඳහා නිවාස තනා දීම සහ ඔවුන්ගේ නිවාස සිහිනය යථාර්ථයක් කරළීමට හැකි වීම.
- ❖ අඩු ආදායම්ලාභී ආන්තික ප්‍රජාව වෙනුවෙන් භාවිත කළ නොකළ ඇඳුම් පැළඳුම්, සපත්තු සෙරෙප්පු, මෙන් ම වියළි සලාක ලබා දීම තුළින් ආර්ථිකමය වශයෙන් යම් අස්වැසිල්ලක් ලබා දීම.
- ❖ අඩු ආදායම්ලාභීන් උදෙසා ප්‍රජා දායකත්වය ලබා ගැනීම.
- ❖ රාජ්‍ය නිලධාරින් සහ රාජ්‍ය ආයතන කෙරෙහි යහපත් ප්‍රතිරූපයක් නිර්මාණය වීම.

## 08. නිර්මාණශීලීභාවය හා නව නිර්මාණ

- ❖ කාර්යාලය තුළ මුදල් කැට තැබීම.
- ❖ කාර්යාලය තුළ භාණ්ඩ එක් රැස් කර සංචිතයක් පවත්වා ගෙන යාම.
- ❖ කාර්යාලයීය නිලධාරීන්ගේ මූල්‍ය හා ශ්‍රම දායකත්වය ලබා ගැනීමට විවිධ වැඩසටහන් නිර්මාණය කිරීම.
- ❖ වැඩසටහන සම්බන්ධ වීඩියෝ පට හා දැන්වීම් නිර්මාණය කිරීම මගින් අනුග්‍රාහකත්වය ලබා ගැනීම.
- ❖ වැඩසටහනෙහි විශේෂ අවස්ථාවන් සමාජ ජාලා මාධ්‍යයේ පළ කිරීම.
- ❖ ප්‍රදේශය තුළ පවත්නා වූ සියලු පාසල්වල කඩින්කඩ පැමිණෙන හා පාසල් නොපැමිණෙන ළමුන්ගේ තොරතුරු ලබා ගැනීම හා ඔවුන් සඳහා විවිධ වැඩසටහන් නිර්මාණය කිරීම.

## 09. පසු විපරම් ක්‍රමවේදය

මෙම සියලු ව්‍යාපෘතිය ම නිරන්තර පසු අධීක්ෂණයකට හා ප්‍රගතිය මැන බැලීමට ලක්වේ.

- ❖ පාසල් උපකරණ ලබා දුන් ළමයින්ගේ ඉගෙනුම් තත්ත්වය පිළිබඳව පාසල හරහා ත්‍රෛමාසික අධීක්ෂණයක් සිදු කිරීම.
- ❖ සත්කාර මුදල් ආධාර කැටය ප්‍රාදේශීය ලේකම් ප්‍රධාන සත්කාර සංවිධායක මණ්ඩලය විසින් මාසිකව ගණනය කර එම මුදල් ලේඛනගත කොට අරමුදලකට බැර කිරීම සහ එමගින් සිදු කරන කාර්යයන් පිළිබඳව ව්‍යාපෘති ගොනුවක් පවත්වා ගෙන යාම.

## 10. තිරසාරභාවය/අඛණ්ඩතාවය

- ❖ විහාරස්ථාන සඳහා සිදු කරන දානමය පිංකම සඳහා කාර්යාලයේ අනෙකුත් අංශ සම්බන්ධ කර ගැනීම.

- ❖ අඩු ආදායම්ලාභීන් ස්වයං රැකියා හා ස්ථිර රැකියා සඳහා යොමු කිරීම තුළින් ඔවුන්ගේ පවුල් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම සහ එමගින් රටේ ජාතික ආදායමට දායකත්වයක් ලබා දීම.

- ❖ දරුවන් උදෙසා පාසල් උපකරණ ලබා දීම තුළින් තවලම කොට්ඨාසයේ සියලුම දරුවන් සාක්ෂරතාවයෙන් පිරිපුන් දරුවන් පිරිසක් බවට පත් කිරීම.

- ❖ අඩු ආදායම්ලාභී ආන්තික ප්‍රජාව වෙනුවෙන් භාවිත කළ නොකළ ඇඳුම් පැළඳුම්, සපත්තු සෙරෙප්පු, මෙන් ම වියළි සලාක ලබා දීම තුළින් ඔවුන් ආන්තික බවින් මුදවා ගැනීම.